අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | **අ. පො. ස. සාමාන්‍ය පෙළ** | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | **උපකාරක ප්‍රශ්න පත්‍ර**

# Dancing(Oriental)

# නැටුම් (දේශීය)



**Question Paper - I, II** | **ප්‍රශ්න පත්‍රය - I, II** (සිංහල මාධ්‍යය)

Nenasa
The National e-learning Portal for The General Education

**මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව** | **අන්තර්ගතය : සෞන්දර්යය ශාඛාව**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | I |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

නැටුම් (දේශීය) **I,II**
நடனம் (சுNjச) **I,II**
Dancing (Oriental) **I,II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
ɥƃɗÿஞ்ɛɟ Öஜ□ ɥɐɛ□ 10 -ɐஞ்ஞ் □Ö□
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**නැටුම් (දේශීය) I**

**විශේෂ උපදෙස් :**

* සියලු ම අයදුම්කරුවන් **I** කොටසේ ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය.එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.**ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් ප්‍රශ්නය සඳහා දී ඇතිකව අතුරෙන් , ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසදෙන කවය තුළ (x ) ලකුණ යොදන්න.**

**කොටස I**

* අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

1.පා සරඹ අභ්‍යාස කිරීමේදී .........................................වලන ඇසුරු කර ගනී.

(1)ප්‍රකාශනාත්මක (2)තාලානුකූල
(3)රිද්මයානුකූල (4) අභිවලන

2.............................."වීර රසය" වඩාත්ම පිළිඹිබු වන ගැමි නැටුමකි.

(1)කඩු නැටුම (2)කුළු නැටුම
(3)තාලම් නැටුම (4)ගොයම් නැටුම

3.බෙර වාදනයේ දී නුහුරු අතින් වාදනය කරන බීජාක්ෂර ලෙස ………….. හඳුනා ගත හැකිය.

(1) ජිත්, නං (2) දිත් , ගුං
(3) තත්, තොං (4) දොo , ජිත්

4."දිවි කඳුරුද ගස එතැන තිබෙන්නේ
..................දිග මොහොල කපන්නේ"

(1)එක් වියතක් (2) තුන් වියතක්
(3) පස් වියතක් (4)සත් වියතක්

5. ශාන්තිකර්මවල අන්තර්ගත පූර්ව චාරිත්‍රයක් නොවන්නේ............................................ යි.

(1) කප් සිටුවීම (2) තොට පේ කිරීම
(3) ගිනි පෑගීම (4) මඩු පේ කිරීම

6.මහනුවර දළදා පෙරහැර හා සබැඳි සතර දේවාල පෙරහැරට අයත් නොවන්නේ ................................පෙරහැරයි.

(1) සමන් දේවාල (2) පත්තිනි දේවාල
(3) කතරගම දේවාල (4) නාථ දේවාල

7. දේවදාසී සංකල්පය මත පදනම්ව ..................................................නර්තන සම්ප්‍රදාය ප්‍රභවය වී ඇත.

(1)කතකලි (2) භරත නාට්‍යම්
(3) මණිපුරි (4) කථක්

8.දැදිගම සූතිඝර චෛත්‍ය අසලින් හමු වූ...................... අයත් වන්නේ රූකම් මූලාශ්‍රයට ය.

(1) ලෝකඩ නළඟන රුව (2) පරාක්‍රමබාහු ප්‍රතිමාව
(3) ශිව නටරාජ ප්‍රතිමාව (4) එල්ලෙන ඇත් පහන

9. නර්තන පරම්පරා සිටි බවට ................................. සෙල්ලිපිය සාක්ෂි දරයි.

(1) සැස්සේරුව (2) පාලමොට්ටායි
(3) පෙරිමියන්කුලම (4) කාලිංග වනෝද්‍යාන

10.සිංහල "කුළු නැටුම" හා සමාන...................................... දමිළ ජනයා අතර ප්‍රචලිත ගැමි නැටුමකි.

(1) අරවි වෙට්ටු (2) කෝලාට්ටම්
(3) සුළකු (4) චෙම්බු

11. කෝලම් රඟ මඩල හා බැඳි සුවිශේෂී කාර්යයන් ඉටුකර ගැනීමට භාවිත කරනුයේ

(1)නව කොළ අත්ත ය. (2) ගොක් අත්ත ය.
(3) අඹ අත්ත ය. (4) වෙස් අත්ත ය.

12. චිත්‍ර කලාවේ භාවිත මූලධර්මයන් ඍජුවම දැක ගත හැකි වන්නේ

(1) බලි යාගයේ දී ය. (2) රිද්දි යාගයේදී ය.
(3) තොරණ් යාගයේදී ය. (4) සූනියම් යාගයේදී ය.


13. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ලක්ෂණ ඇතුලත් ගායන විශේෂය වන්නේ

(1)නමස්කාර ගායනා ය. (2) සන්න ය.
(3) ටීකා සීපද ය. (4)සිරසපාද ගායනා ය.

14. පුද්ගල චිත්ත සන්තානය තුල හටගන්නා භාවයන් ඉස්මතු කිරීම සඳහා වඩාත් උචිත වන්නේ

(1)ආහාර්ය අභිනය යි. (2) වාචික අභිනය යි.
(3) ආංගික අභිනය යි. (4)සාත්වික අභිනය යි.

15.

| | | | |
|---|---|---|---|
|  |  |  |  |
| **A** | **B** | **C** | **D** |

ඉහත රූප අතුරින් දේශීය ශාන්ති කර්මයක රංග භාණ්ඩයක් ලෙස යොදා ගන්නා ඝණ වාද්‍ය භාණ්ඩය වන්නේ

(1) A (2) B
(3) C (4) D

16. මුල් කාලීනව ගායනය සඳහා නිර්මාණය වී පසු කාලීනව ශාස්ත්‍රීය නර්තනාංගයක් බවට පත්වූ ගායනා විශේෂයකි.
(1) වන්නම් (2) සවරම
(3) රබන් (4)මෝල්ගස

17.ප්‍රථම රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල පවත්වනු ලැබූ වර්ෂය වන්නේ
(1)1960 (2) 1961
(3) 1962 (4)1965

18. නවරාත්‍රී උත්සවයෙහි අවසානය සනිටුහන් කරන සුවිශේෂී අවස්ථාව වන්නේ
(1) මාට්ටු පොංගල් ය. (2) අරංගේත්‍රම් ය.
(3) හෝලි ය. (4) විජය දශමි ය.

19. "මුත්තුකාරන් හා පත්තුකාරන්" යන ශිල්පීන් පිළිවෙලින් හමුවන්නේ
(1)කථක් , භරත (2) මනිපුරි,කතකලි
(3) භරත,කතකලි (4)භරත,මනිපුරි

20.පහත ප්‍රකාශ අතුරින් " දේශීය නර්තනයේ නව ප්‍රවණතා" සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) නර්තනය හා බැඳී සාරධර්ම මුළුමනින්ම යටපත් වී ඇත.
(2) වෘත්තිමය තත්වයන් උදාවී ඇත.
(3) ප්‍රාසාංගිකත්වයට මුල් තැනක් ලැබේ.
(4)ජාත්‍යන්තර වේදිකාවට නිර්මාණ බිහි වේ.

21.ගුරුගේ මාලාව,පොත්කඩේ පාලිය,වඩිග පටුන, යන අවස්ථා දක්නට ලැබෙන්නේ පිළිවෙලින්,

(1) උඩරට,සබරගමු,පහතරට සම්ප්‍රදායන්වලය.

(2) උඩරට,පහතරට,සබරගමු සම්ප්‍රදායන්වලය.

(3) සබරගමු,උඩරට,පහතරට,සම්ප්‍රදායන්වලය.

(4)සබරගමු,උඩරට,ද්‍රවිඩ, සම්ප්‍රදායන්වල ය.

22. "ලාහක් විතර වී අව්වේ වනාලා." මෙම කවිය ගයනු ලබන්නේ
(1)ගොයම් කැපීමේ කවි වලදීය. (2)මොල් ගස් කවි වලදීය.
(3). සොකරි කවි වලදීය. (4)කුළු නැටුමේ කවි වලදීය

23. 2+2+3 යන තිත් රූපය නම්කරනු ලබන්නේ.
(1)දෙසුළු මහ තුන් තිත ලෙසය. (2) දෙසුළු මැදුම් තුන් තිත ලෙසය.
(3) දෙමැදුම් මහ තුන් තිත ලෙසය. (4)සුළු මැදුම් දෙතිත ලෙසය.

24. නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගන්නා සමාජීය වටිනාකමක් නොවන්නේ
(1)නායකත්ව කුසලතා වර්ධනය (2) අන්‍ය අදහස් ගරුකිරීම
(3) සමාජීය පිළිගැනීම (4) පෞරුෂ වර්ධනය නොවීම

- **ප්‍රශ්න අංක 25 සිට 28 දක්වා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරින් තෝරන්න**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | මඩුපුරය | තොරණ් යාගය | පොත්කඩේ පාලිය | මල්හත් පදය |
| 2 | සිලම්බු | විලංග | රහු | ගුංගුරු |
| 3 | පොල් පන්දම | ගගණය | සළඹ | චන්ද්‍ර පිරෙයි |
| 4 | කාල පන්දම් ගස | දෙවොල් තොරණ | බිසෝ කප | අයිලය |

25. කොහොඹා කංකාරිය සහ බලි ශාන්ති කර්මයේ දී යොදා ගන්නා රංග භාණ්ඩ දෙකක් පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ ,
(1)3 පේලියේ A සහ B (2) 3 පේලියේ B සහ C
(3) 4 පේලියේ A සහ D (4)4 පේලියේ C සහ D

26. උඩරට නර්තන ශිල්පියාගේ සහ කථක් නර්තන ශිල්පියාගේ පාදයට පළඳින ලබන ආභරණ දැක්වෙන පිළිතුර,

(1) 2 පේලියේ A සහ C (2 ) 2 පේලියේ B සහ C

(3) 2 පේලියේ A සහ D (4) 3 පේලියේ C සහ D

27. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පමණක් දක්නට ලැබෙන සැරසිලි අංගයක්

(1)4 පේලියේ A තීරුව (2) 4 පේලියේ D තීරුව

(3) 4 පේලියේ C තීරුව (4) 4 පේලියේ B තීරුව

28. පහන් මඩු ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය අවස්ථාවක් දැක්වෙන පිළිතුර

(1)1 පේලියේ A තීරුව (2) 1 පේලියේ B තීරුව

(3) 1 පේලියේ D තීරුව (4) 1පේලියේ C තීරුව

29. කැළණි පාලම වෙදිකා නාට්‍ය අයත් වන දේශීය නාට්‍ය ශෛලිය වන්නේ

(1) තාත්වික නාට්‍ය (2) මුද්‍රා නාට්‍ය

(3) ගීත නාට්‍ය (4)ශෛලීගත නාට්‍ය

30.“දී කිරි දීකිරි " ගීතයට නර්තන නිර්මාණය කිරීමේදී වඩාත් උචිත චලන වර්ගය වන්නේ

(1)තාලානුකූල චලන ය. (2) රිද්මයානුකූළ චලන ය.

(3) ප්‍රකාශනාත්මක චලන ය. (4) ස්තිරීක චලන ය.

## 11 කොටස - උඩරට නර්තනය

31. ගැටබෙර වාදනයේදී මූලික සතර බීජාක්ෂර වන්නේ

(1) තත් ,දිත්,තොං,නං (2) තත්,ජිත්,තොං,නං.

(3) තත්,දිත්,දොං,නං. (4)තත්,ජිත් දොං,නං.

32.“තත් තත් තක්කඩ කඩතක " යන කස්තිරම අදාල වන ගොඩ සරඹය වන්නේ

(1) නව වන සරඹයයි. (2) දහවන වන සරඹයයි.

(3) එකලොස් වන සරඹයයි. (4) දොලොස්වන වන සරඹයයි.

33.වෙස් ඇදුම් කට්ටලයේ හිසට පළඳින ආභරණයකි

(1) හඟල (2) බුබුළු පටිය

(3) අවුල් හැරය (4) පායිම්පත

34.උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි පාරිභාෂිත වචනය ඇතුලත් වරණය තෝරන්න

(1)මාලක්කම්,කොලොන්න පද,ගගණය

(2) සුරල් තට්ටුව,අන්ත අඩිය,කඩිනම්

(3) සුරත් තට්ටුව,සීරුමාරුව,කෛමෙත්ත

(4)කඩිප්පුව,කොලොන්න පද,රඟු

35...........................................ජිං තත් ජිං තත් තත්...........................දොම්කිට කුඳ, යන අඩව්වෙහි හිස් තැනට සුදුසු පද කොටස් වන්නේ,

(1)තාම් ජිං තත් තත්, දොහොකඩ තහකඩ

(2) තාත් ජිත් කුංදත්,තක්කඩ තරිකිට.

(3) තාම් දොමිත් ගත ,කඩගක ගකුදඩ.

(4) තාක්කු තක්කුං තරිකිට, දොංගඩ කඩතක

36. පිළිවෙලින් මාත්‍රා 4+4 සහ මාත්‍රා 2+4 තාල රූප වලට අයත් වන්නම් දෙකක් වන්නේ

(1) තුරඟා සහ සැවුලා ය. (2) සිංහරාජ සහ හනුමා ය.

(3) වෛරොඩි සහ මුසලඩි ය. (4)සිංහරාජ සහ සැවුලා ය.

37. උඩරට නර්තන සම්ප්‍රදායේ අයත් ප්‍රවීණ බෙර වාදන හා නර්තන ශිල්පියෙකි

(1)ගෝමිස් ගුරුතුමා (2) නිත්තෙවෙල ගුණයා ගුරුතුමා

(3) රද්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා (4)සව්රිස් සිල්වා ගුරුතුමා

38. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ අන්තර්ගත ගායනය සහිත නර්තන අංගයකි
    (1)යක් ඇන්නුම (2) කුවේණි අස්න
    (3) හත් පදය (4) ආවැන්දුම
39. ගැටබෙරය වාදනය කරන අවස්ථා පමණක් ඇති පිළිතුර තෝරන්න
    (1) මඟුල් බෙර,හේවිසි වාදනය (2) මළ බෙර,තේවා වාදනය
    (3) රණ බෙර,අත්‍යා බෙර (4) මඟුල් බෙර,අත්‍යා බෙර

40. මාත්‍රා 3+3 ට වාදනය කළ හැකි අලංකාර බෙර පදයකි
    (1)කුදාංත ගත දොං (2) ජිං තරිකිට ජිං රුකුතක
    (3) තෙහිං තකු තෙහිංතකු තෙහිං ජිං (4)දොං දොං ජිං ජිං ගජි ගත

## 111 කොටස - පහතරට නර්තනය

31.පහතරට බෙර වාදනයේදී මූලික බීජාක්ෂර වනුයේ
    (1)තත්,ජිත්, තොං,නං. (2) තත්,දිත්,තොං,නං.
    (3) තත්,දිත්,රිං,නං. (4)තත්,ජිත්,දොං,නං.

32.“ ගුදිත ගදිත ගත ගත් දැහිං ගුං දැහිං" යන ඉරට්ටියට අදාල ඉලංගම් සරඹය වන්නේ
    (1) නවවන සරඹයයි. (2) දහවන සරඹයයි.
    (3) එකලොස්වන සරඹයයි. (4) දොළොස්වන සරඹයයි.

33.තෙල්මේ ඇඳුම් කට්ටලයේ හිසට පළඳින ආභරණයකි
    (1)පබළු හැට්ටය. (2) තෙල් කච්චිය.
    (3) හැඩ කැල්ල. (4)නළල් පටිය.
34. පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි පාරිභාෂික වචන ඇතුලත් වරණය තෝරන්න
    (1) සුරත් තට්ටුව ,සීරු මාරුව,කෙමෙත්ත.
    (2) කඩිප්පුව ,කොලොන්න පද,රඟු.
    (3) සුරල් තට්ටුව, අන්තාඩිය,මාලක්කම.
    (4)බෙර පුහුල, අත්මල,කඩිප්පුව.
35. .........................................................දිමි ගත ගුගුදිත ගත...............................දොම් යන ඉරට්ටියෙහි හිස්තැන් සඳහා සුදුසු පද කොටස් තෝරන්න
    (1)දොම් තත් , ගුහිති ගදිරිකිට (2) දිමි ගත, දිරිකිට තරිකිට
    (3) රිමි ගත ,ගත් දිරිකිට (4)තත් ගුද,තරිකිට දිරිකිට
36.පිලිවෙලින් 4+4 සහ 2+4 යන තාල රූප වලට අයත් සිංදු වන්නම් වනුයේ

    (1)ශුද්ධ තාලය සහ අනුරාග දණ්ඩ තාලයයි.
    (2) හනුමන්තා තාලය සහ ශුද්ධ තාලයයි.
    (3) ඊෂ්වර කුණ්ඩ තාලය සහ නාතිලිංචි තාලයයි.
    (4) අනුරාග දණ්ඩ තාලය සහ නාතිලිංචි තාලයයි.
37. පහතරට නර්තනයේ ප්‍රවර්ධනයට කටයුතු කල ප්‍රවීණ ශිල්පියෙකු වන්නේ
    (1) නිත්තෙවෙල ගුණයා ගුරුතුමා (2) එස්.එච්.සචිරිස් සිල්වා ගුරුතුමා
    (3) රද්දැල්ලේ පොඩිමහත්තයා ගුරුතුමාය. (4)ජී.වී.හීන් නිලමේ ගුරුතුමාය.
38. දෙවොල් මඩුව ශාන්ති කර්මයෙහි අන්තර්ගත නාට්‍යමය අවස්ථාවක් වන්නේ
    (1)පොත්කඩේ පාලිය (2) අඹ විදමන
    (3) ගබඩා කොල්ලය (4)ගුරුගේ මාලාව
39. දෙවොල් බෙර වාදනය දැක ගත හැකි අවස්ථාවක් සහිත පිළිතුර තෝරන්න
    (1) හේවිසි (2) සොකරි
    (3) කොහොඹා කංකාරිය (4)සින්දු වන්නම්

40.පහතරට නර්තන සම්ප්‍රදාය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න
(1)කෝලම් ගැමි නාටකයට පිටිවහලක් වී ඇත.
(2) දළදා පෙරහැරේදී දැකගත හැකිය.
(3) ආහාර්ය අභිනයෙන් වඩාත් පොහොසත්ය.
(4) ලාස්‍ය අංගහාර වලින් යුතුය.

## IV කොටස - සබරගමු නර්තනය

31.“දවුල හා බැඳි සතර බීජාක්ෂර වන්නේ"
(1)තත්,දිත්,තොං,නං (2) තත්,ජිත්,තොං,නං
(3) තත් ,ජිත්,රිම්,නං (4)තත්,කඩ,ජිත්,නං

32.“කිත් තා කිත් තා ජෙජ් ජේං තා" යන පද කොටස අයත් වන දොඹින පදය වන්නේ
(1) හත්වන පදයයි (2) අටවන පදයයි
(3) නවවන පදයයි. (4) දහවන පදයයි.

33.“පබළු" ඇඳුම් කට්ටලයේ හිසට පළඳිනු ලබන ආභරණයක් වන්නේ,
(1)ශිඛා බන්ධනයයි. (2) නළල් පටියයි.
(3) පායිම්පත යි. (4) නෙත්ති මාලයයි.

34. සබරගමු නර්තන සම්ප්‍රදාය හා බැඳි පාරිභාෂිත වචන ඇතුලත් වරණය තෝරන්න.

(1) මාලක්කම්,ගගණය,බෙර පද.
(2) සුරල් තට්ටුව, අන්තාඩිය,කඩිනම්.
(3) කොළොන්න පද ,කලාසම,අත්පොට සතර
(4)සුරත් තට්ටුව ,සීරු මාරුව ,කෙමෙත්ත.

35. .................................................. ජික් කිට කුම්...........................ගත කිත් තත් යන අඩව්වෙහි හිස් තැනට සුදුසු පද කොටස් වන්නේ
(1)තත් කිටහර්, තත් කිත් තත් (2) ගති කිටහර්, ගති කිත්තත්
(3) තකුද ගතත්, ජෙං තත් තත් (4)දෝං ගත,ගත කිටිතක

36. පිළිවෙළින් මාත්‍රා 4+4 සහ 3+4 යන තාල රූප වලට අයත් වන්නම් දෙකක් වන්නේ
(1)අනිලා සහ කොවුලාය (2) කදම්භ පක්ෂි සහ තිසරාය
(3) තිසරා සහ විරාඩිය (4) විරාඩි සහ මණ්ඩුකය

37. සබරගමු නර්තනයෙහි ප්‍රවර්ධනයට කටයුතු කල ප්‍රවීණ ශිල්පියෙකු වන්නේ
(1)සව්රිස් සිල්වා ගුරුතුමා (2) රද්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා
(3) නිත්තේවෙල ගුණයා ගුරුතුමා (4) එස්. පණී භාරත ගුරුතුමා

38. පහන් මඩුව ශාන්ති කර්මයෙහි අන්තර්ගත ගායන සහිත නර්තනයකි
(1)යහන් දැක්ම (2) මල් මඩු පුරය
(3) දේව කෝල් පාඩුව (4) මුදුන් තාලය

39. දවුල් වාදනය දැකගත නොහැකි අවස්ථාවක් සහිත පිළිතුර තෝරන්න
(1)අණ බෙර (2) පංච තූර්ය වාදනය
(3) හේවිසි වාදනය (4)අත්‍යා බෙර වාදනය

40. මාත්‍රා 3+4 තාල රූපයට වාදනය කල හැකි දවුල් පදයකි
(1)දෝං ජිං ජිං තකට දොං තක (2) කුදක් තක්කිට තකට ජිමිතක
(3) ගුංද ගතිගත ගත්ත ගුදි ගුද (4) ජිං කිටිතත් තත් කිටිතක

****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

නැටුම් (දේශීය) I,II
நடனம் (சுNjச) I,II
Dancing (Oriental) I,II

නැටුම් (දේශීය) I,II

I I කොටස

**(1)**

(1) ශාන්ති දේව් ඝෝෂ් මහතා විසින් 1936 දී නිර්මාණය කරන ලද ........................................ මුද්‍රා නාට්‍යය මෙරට නිෂ්පාදනය ලද ප්‍රථම මුද්‍රා නාට්‍යයයි.

(2) කතකලි නර්තනය උගන්වන ප්‍රධාන අධ්‍යාපන ආයතනය ..........................වේ.

(3) "පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම " යන කවි පදය ....................................ගායනයට අයත් වේ.

(4) දෙසුළු ................තුන් තිතේ තාල රූපය 2 + 2 + 4 ලෙස දක්වයි.

(5) පහතරට සින්දු වන්නම් .............................. දෙවියන්ගේ ගුණ ගායනය අරමුණු කර නිර්මාණය වී ඇත.

(6) දෙපනෝ ............................. නාට්‍ය වර්ගයට අයත් වේ.

(7) කරදිය මුද්‍රා නාට්‍යයෙහි පසුතල නිර්මාණය හා රංගවස්ත්‍ර නිර්මාණය ............................... ශිල්පියා විසින් සිදුකර ඇත.

(8) මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් 1980 දී ....................................නැටුම වේදිකාවට හඳුන්වා දෙන ලදී.

(9) ජස කෝලම හා සම්බන්ධ කාන්තා චරිත වන්නේ, (අ)............................... සහ (ආ) ……...........................................ය.

(10)පහත සඳහන් භාවයන් තුළින් උපදින රස නම් කරන්න.
(අ ) විස්ම - ......................................    (ආ ) උත්සාහ - ...........................................

**(2)** පහත දැක්වෙන බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.

i. "දො දොංත තකු දොං"

"රෙගුද ගතකු දොම්"

"ජිමිතකු දා දොම්"

ii. පහත දැක්වෙන කවි පදය මාත්‍රා තුනේ (3+3) තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"පුරවර මැද බැඳි රන් ඔංචිල්ලා........."

iii. මාත්‍රා 3+4 තාලයට අයත් අඩව්වක් හෝ මාත්‍රා 2+2+3 තාලයට අයත් ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

**(3)** පහත දැක්වෙන මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ද්‍රවිඩ ගැමි නැටුම්

ii. ප්‍රස්තාරකරණය

iii. කඩතුරා කවි

iv. පංච තූර්ය වාදනය

v. සතර අභිනය

**(4)** දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ශාන්ති කර්ම තුළ සුවිශේෂී ලක්ෂණ හඳුනා ගත හැකිය.

i. ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු දෙකක් හඳුන්වන්න.

ii. කොහොඹාකංකාරිය, දෙවොල්මඩුව සහ පහන්මඩුව යන ශාන්ති කර්මවල භාවිත ප්‍රධාන ඇඳුම් කට්ටල පිළිබඳ ව කෙටියෙන් පැහැදිළි කරන්න.

iii. දෙවොල් මඩුව ශාන්තිකර්මයෙහි කතා පුවත මඟින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න.

**(5)** ගැමි නැටුම් සහ ගැමි නාටක තුළින් විවිධ වූ ශ්‍රී ලාංකීය ජන ජීවන තොරතුරු හෙළිදරව් වේ.

i. සොකරි ගැමි නාටකයේ පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා එහි රඟමඬල කෙටියෙන් හඳුන්වන්න.

ii. ගැමි නැටුම් හා බැඳි ගායනා තුළින් පිළිබිඹුවන සමාජ සහජීවනය පිළිබඳ ව නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

iii. ගැමි නැටුම්වල දීර්ඝ ඉතිහාසයක් ඇති බව ඔබ උගත් රූකමක් හෝ දේශාටන වාර්තාවක් ඇසුරින් සනාථ කරන්න.

**(6)** පහත දැක්වෙන රූපරාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
|  |  |  |
| **A** | **B** | **C** |

i. මෝගල් රාජ සමයේ සංවර්ධනය වූ නර්තන සම්ප්‍රදාය ඉහත ඡායාරූප තුළින් තෝරා නම් කර, එහි සංගීතය පිළිබඳ  හැඳින්වීමක් කරන්න.

ii. A රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එහි ඉණට,ගෙලට හා නළලට පළඳින ආභරණ කොටස් තුනක් හඳුන්වන්න.

ii. ඊශානදිග භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය ඇතුළත් රූපය තෝරා එම සම්ප්‍රදාය හා බැඳි ආගමික පසුබිම විස්තර කරන්න.

**(7)** 21 වන සියවස වන විට සාම්ප්‍රදායික නර්තන කලාවේ නව ප්‍රවණතා දැකගත හැකිය.

i. " රංග වස්ත්‍ර නිර්මාණකරණය"

ii. "සමාජයීය අවශ්‍යතාවයන්ට අනුව නර්තනය යොදා ගැනීම"

iii. "ප්‍රාසාංගික බව වර්ධනය කිරීමට තාක්ෂණය භාවිතය"

යන ශීර්ෂ ඔස්සේ ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

******